# ක්‍රිස්තියානි ධර්මය

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගය**

## *පසුගිය විභාග ප්‍රශ්නෝත්තර*

## *2016*

**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ**

**ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසමේ ප්‍රකාශනයකි.**

## ලකුණු දීමේ පටිපාටිය

1 වන පත්‍රය

| | | ලකුණු |
|---|---|---|
| (1) 1 වන පත්‍රය සඳහා ප්‍රශ්න 40 x 1 බැගින් | = | 40 |

11 වන පත්‍රය

(2) 1 වන ප්‍රශ්නය අනිවාර්ය වේ.

| | | |
|---|---|---|
| එහි එක් කොටසකට ලකුණු 02 බැගින් | = | 20 |

සෙසු තෝරා ගත් ප්‍රශ්න වලට ලකුණු පිරිනැමිය යුත්තේ

| | | ලකුණු |
|---|---|---|
| සෑම ප්‍රශ්නයක්ම | අ) | 02 |
| | ආ) | 03 |
| | ඉ) | 05 |
| | | 10 |

| | | |
|---|---|---|
| තෝරා ගත් ප්‍රශ්න 4ට ලකුණු 10 බැගින් | = | 40 |

11 වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60කි

| | | |
|---|---|---|
| මුළු ලකුණු සංඛාව | = | 100 |

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2016

## දෙසැම්බර්

## ප්‍රශ්න හා පිළිතුරු

### ක්‍රිස්තියානි ධර්මය 1 හා 11

**සැලකිය යුතුයි**

I. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4), යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාන්න.

(1) වනාන්තරයේ සමිඳුන්හට මාවතක් එළි කරන්න. මෙසේ පැවසුවේ කවුද?

(1) දිවැසිවර යෙසායා
(2) දිවැසිවර මීකා
(3) දිවැසිවර මලාකි
(4) දිවැසිවර ආමොස්

(2) සෙකරියස් හා එළිසබෙත් යන දෙදෙනාට පොදු චරිතාංග නොවූයේ,

(1) ධර්මිෂ්ඨකම හා ඇදහිල්ලයි
(2) ප්‍රශංසාව හා සැකයයි
(3) අනුමානය හා නිහතමානීත්වයයි
(4) තේරුම් කිරීමේ හා තේරුම් ගැනීමේ හැකියාවයි

(3) මරියතුමියගේ ජීවිතාදර්ශය අනුව ඔබ විශේෂයෙන්ම,

(1) ඕනෑම පණිවුඩයකට ක්ෂණික ප්‍රතිචාර දැක්විය යුතුයි.
(2) ඥාතීන්ට සැලකිලි දැක්විය යුතුයි.
(3) දේව කැමැත්තට අවනත විය යුතුයි.
(4) ශුභාරංචි ප්‍රාර්ථනා කළ යුතුයි

(4) පිලිප්පියේ කාන්තා නායකත්වය දැරුවේ,

(1) ප්‍රිස්කිලාය
(2) දොර්කස්ය
(3) ලිදියාය
(4) නපුරු ආත්මයෙන් නිදහස් වූ කාන්තාවය

(5) දිවැසිවර යෙසායාට අනුව ජේසුස් වහන්සේ,

(1) බෙත්ලෙහෙමේ විසුවන්ට බලාපොරොත්තුවක් විය.
(2) ගනඳුරේ විසුවන්ට ආලෝකයක් විය.
(3) බැබිලෝනියානු විප්‍රවාසීන්ට සොම්නසක් විය.
(4) දිවැසිවරන්ට මහත් බලපෑමක් විය.

(6) පිලාත් ජේසුතුමා කුරුසිපත් කිරීමේ තීරණය දුන්නේ,

(1) නීතියට ගරු කළ බැවිනි
(2) ජනතා උද්ඝෝෂණය ප්‍රබල වූ බැවිනි.
(3) බරබ්බස් නිදහස් කිරීමට අවශ්‍ය වූ බැවිනි
(4) ජේසුතුමා නිදහස නොඉල්ලූ බැවිනි

(7) කිතුනු බෞතිස්මයේදී හිමි වන දේව වරප්‍රසාදය කුමක්ද?

A. ශුද්ධාත්මයාණන් තුළින් වන නව ජීවිත පැවැත්මයි
B. ශාරීරික පවිත්‍රතාවයයි.
C. සමාජ පිළිගැනීම හිමිවීමයි
D. පාප කමාව ලැබීමයි.

මින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය.
(3) A හා D ය. (4) B හා D ය.

(8) ස්නාවක ජොහාන් අද සමාජයට පැමිණියොත් සාමාන්‍ය ජනයාට කියනු ඇත්තේ කුමක්ද?

(1) සාධාරණත්වයේ වටිනාකම (2) නිවැරදිව නිල බලය යෙදවීමේ වටිනාකම
(3) ක්‍රියාකාරී ඇදහිල්ලක වටිනාකම (4) බෙදාගැනීමේ වටිනාකම

(9) "මා පියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නහුද?" මින් අපට ලැබෙන මඟ පෙන්වීම වන්නේ,

(1) දේව රාජ්‍යයේ මෙහෙවර වටහා ගත යුතු බවයි. (2) වැඩිහිටියන්ගේ දැනුම පිරික්සිය යුතු බවයි
(3) නිතර දෙවි මැදුරෙහි රැඳී සිටිය යුතු බව (4) දෙමාපිය අසුරින් වුවද ඇත්විය යුතුබව

(10) දේව රාජ්‍යයේ වර්ධනය පතන්නන්,

(1) කිතුනු සභාවන් පුළුල් කළ හැකිය (2) බාධක නැති බවට උපකල්පනය කළ යුතුය
(3) සැම කල්හිම එකම වර්ධනයක් පැතීය යුතුය (4) දේව බලය කෙරේ විශ්වාසය තැබිය යුතුය

(11) සාමය යථාර්තයක් වීම සඳහා,

(1) දේශපාලන ස්ථාවරත්වයන් පැවතීම අත්‍යවශ්‍ය වේ (2) යුක්තිය හා ධර්මිෂ්ඨකම ඉටුවීම අත්‍යවශ්‍ය වේ.
(3) ප්‍රචණ්ඩත්වය හෙළා දැකීම අත්‍යවශ්‍ය වේ. (4) අනුන් විනිශ්චය කිරීමෙන් වැළකීම අත්‍යවශ්‍ය වේ

(12) ඔබේ ඉඟ පටිය බැඳ ගන්න. පහන්ද දල්වා තබා ගන්න.මෙයින් අනාවරණය කෙරෙන සත්‍යක් නොවන්නේ,

(1) අපේක්ෂාවෙන් සිටීමය (2) සූදානමින් සිටීමය
(3) දැනුම් දෙන තෙක් සිටිමය (4) අවදිව ඉවසිල්ලෙන් සිටිමය

(13) යහපත් එඬේර ගුණාංග අනුව කිතුනු නායකයන්,

(1) ඔවුන්ගේ අධිකාරීත්වය ප්‍රකාශ කළ යුතුය (2) රැළේ ස්භාවය අධ්‍යනය කළ යුතුය
(3) රැළ සංඛ්‍යාත්මකව වර්ධනය කළ යුතුය (4) කැපවීමෙන් යුතුව රැළ පෝෂණය කළ යුතුය

(14) ප්‍රේමයේ විශිෂ්ටත්වය හෙළිවන්නේ,

(1) දෙවිඳුන්ට හා අවශ්‍යතා ඇති අයට ප්‍රේම කිරීමෙනි (2) නපුරට යටත් නොවීමෙනි
(3) වැඩිහිටියන්ට අවනත වීමෙනි (4) විනීතව හැසිරීමෙනි

(15) සාම යුගය ගැන පැවසුවේ,

(1) දිවැසිවර ආමොස්ය (2)දිවැසිවර මීකාය
(3) දිවැසිවර මලාකිය (4) දිවැසිවර හොසියාය

(16) රෝම ගමනේදී කුණාටුවට මුහුණ දුන් පාවුල්ගෙන් පන්නරය ලබන කිතුනුවන් ජීවිත අර්බුද වලදී,

(1) ධන සම්පත් පරිහරණය කළ යුතුයි (2) අර්බුද වල ස්භාවය හඳුනාගත යුතුයි
(3) ප්‍රශ්න වලින් පලා යා යුතුයි (4) ඇදහිල්ලෙන් සාක්ෂි දැරිය යුතුයි

(17) සාකෙවුස්ගේ ජීවිත පරිවර්තනයට ප්‍රධාන හේතුව වූයේ,

(1) තම වරද අවබෝධ කර ගැනීමට ගත් උත්සහයයි (2) ජේසුතුමා හමුවීමට තිබූ ආශාවයි
(3) ජේසුතුමා ඔහුව පිළිගැනීමයි (4) ජනතාව ඔහුව කොන් කිරීමයි

(18) ජේසුතුමා මෙන් අද කිතුනුවා මුහුණ දෙන කාලීන පරික්ෂාවන් වන්නේ,

A. ආහාර සැපයීමේ අභියෝගයයි

B. නපුරේ බලයට කීකරු වීමේ අභියෝගයයි

C. ජනප්‍රියතාවය දිනාගැනීමේ අභියෝගයයි

D. දේව බලය මෙහෙයවීම පිළිබඳ අභියෝගයයි

මින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය.
(3) B හා D ය. (4) C හා D ය.

(19) සාධාරණය හෙළි කරන ප්‍රකාශනයක් වන්නේ,

(1) මාගේ පාප වලින් මා පිවිතුරු කළ මැනව යන්නය.
(2) යුක්තිය ගලා බසින දිය දහරක් මෙන්ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන්ද පැවතිය යුතුය යන්න
(3) ඔවුහු තමන්ගේ කඩුවලින් නගුල්ද හෙල්ල වලින් දෑකැති ද හදා ගත්තෝය යන්නය.
(4) එකිනෙකා තම තමාගේ මිදි වැල යටද අත්තික්කා ගස යටද යෙහෙන් වාසය කරනු ඇත යන්නය

(20) පාවුල් එපීසියේදී කළ දෑ ඇසුරින් අද ඇතැම් කිතුනුවන් මුහුණ දෙන අභියෝගය නම්,

(1) රැකියාවෙන් ඉවත් වුවද නව මාර්ග සෙවීමයි (2) මිත්‍යා මත වලින් වැළකී එකම දෙවිඳුන් නැමදීමයි
(3) අරගල හමුවේ පසුබෑමයි (4) වැරදි දෑ අනුකරණයට පෙළඹීම

(21) දේවගැති සේවය සඳහා වූ කැඳවීමකට ලත් වැදගත්ම ප්‍රතිචාරය වූයේ,

(1) දේව ධර්මය හදාරා පැමිණෙමි යන්නයි.
(2) සොයුරියන්ගේ අධ්‍යාපනය නිමවූ විට පැමිණෙමි යන්නයි.
(3) උසස් අධ්‍යාපනය මදකට පසක ලා පැමිණෙමි යන්නයි.
(4) මුළු කාලය සේවයට කැප කරමින් පැමිණෙමි යන්නය

(22) සමාජයේ නොමඟ ගිය දරුවන් ගැන කිතුනු ඔබේ වගකීම වන්නේ,

(1) ඔවුන්ට දේව රාජ්‍යයේ අපේක්ෂා වටහා දීමයි
(2) ඔවුන් නොමඟ යාමට හේතු විමසීමයි
(3) මනස්ථාපනය තුළ දේව දරුකම පෙන්වා දී පිළිගැනීමයි
(4) ඔවුන්ට පාපයේ භයානකකම පහදා දිමයි

(23) දුක් විඳින සේවකයා අනුගමනය කරන කිතුනුවා සේවයේදී,

(1) දුක් විඳීම තුළින් බැහැර විය යුතුය (2) දුක් විඳීමේදී හා වැය වීමේදී ජයග්‍රාහි විය යුතුය
(3) දුක් පීඩා හමුවේ දී දේව කැමැත්ත සෙවිය යුතුය (4) දුකට පත්වූවන්ට අනුකම්පාව දැක්විය යුතුය

(24) මුල් ගෝලයින්ගෙන් අද කිතුනු සභාවට එල්ල වන ප්‍රබල අභියෝගය වන්නේ,

(1) මිනිසුන් සතුටු කිරීමයි (2) නායකත්වය අවනත වීමයි
(3) විවිධත්වය තුළ එකමුතුකමයි (4) ධීවර කාර්යයේ යෙදීමයි

(25) දේව රාජ්‍යයේ උරුමය ලැබීමේ භාග්‍ය දිළිඳුන්ට හිමි වන්නේ,

(1) ඔවුන්ගේ අගහිඟකම් සපිරෙන බැවිනි (2) ඔවුන් දෙවිඳුන් තුළ රැඳී සිටින බැවිනි
(3) ධනවත් වීම අභාග්‍යයක් බැවිනි (4) ඔවුන්ට සිනාසීමට හැකි බැවිනි

(26) පීඩනයට පත්වන්නන්ට ඉශ්‍රායෙල් ඉතිහාසයෙන් ලැබෙන මඟපෙන්වීම වන්නේ,

(1) නිරතුරුව දෙවිඳුන් අයැදීමයි
(2) පීඩකයින්ට විරුද්ධව කෙඳිරීමයි
(3) පීඩකයින්ට විරුද්ධව නැගී සිටීමයි
(4) පීඩනය දරාගෙන සිටීමයි

(27) ජේසුතුමාගේ ජයාන්විත ජෙරුසෙලමේ ගමනින් පන්නරය ලබන කිතුනුවා,

(1) නිහතමානීව පමණක් ක්‍රියා කළ යුතුය
(2) සාමයෙන් සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතුය
(3) වීදි වල ජය සෝෂා නැගිය යුතුය
(4) වීර ලීලාවෙන් කටයුතු කළ යුතුයි

(28) අරිමාතියේ ජෝසප්ගේ ක්‍රියා කලාපය සුවිශේෂී වන්නේ ඔහු,

(1) ජේසුතුමාගේ මෘත දේහයට ගෞරව දැක්වූ බැවිනි
(2) ජුදෙව්වන්ගේ ක්‍රියා කලාපය හෙළා දුටු බැවිනි
(3) ජේසුතුමා ළඟින් ඇසුරු කළ කෙනෙකු බැවිනි
(4) තීරණාත්මක අවස්ථාවක සත්‍යට සාක්ෂි දැරූ බැවිනි

(29) ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් ජේසුතුමා තුළ සම්පූර්ණ වීම අනාවරණය වූයේ එතුමා,

(1) ජොර්දාන් ගඟේ බෞතිස්මය ලැබූ විට ය.
(2) ජීවමාන ජේසුස් වහන්සේ බවට පේදුරු සාක්ෂි දැරූ විට .ය
(3) කන්දක් මත රූප විපර්යාසය අත්දුටු විට ය.
(4) උත්ථානයෙන් පසු ගෝලයන්ට දර්ශනය වූ විටය

(30) ජේසුතුමාගේ ගෙත්සෙමනේ යැදුම අනුගමනය කරන ඔබ,

(1) අධ්‍යාත්මික ගැටුමට මුහුණ දිය යුතුය
(2) සතුරන් වෙනුවෙන් අයැදිය යුතුය
(3) ජනතාවට සාමය උදා කළ යුතුය
(4) අත්මාර්ථය නසා දේව කැමැත්තට ඉඩ දිය යුතුය

(31) ජේසුතුමා පැවසූ පරිසිවරුන්ගේ ඇතුළාන්ත හිස්කමට නිදසුනක් වන්නේ,

(1) කෙනෙකු දෙව් මැදුරු ශාලාව විශාල කොට තම නම කෙටීමයි
(2) කෙනෙකු මියගිය අයෙකුගේ නැති ගුණ පැවසීමයි
(3) කෙනෙකු ශාරීරික පවිත්‍රතාවය ගැන මහත් සේ සැලකීමයි
(4) කෙනෙකු වැඩිහිටි නිවාසයක් සඳහා මුල් ගල තැබීමයි

(32) ආබ්‍රහම්ගේ හා මෝසෙස්ගේ බලාපොරොත්තු අතීශයින් වැදගත් වූයේ,

(1) ඒවා දේව කැමැත්ත ඉටු කිරීමේ බලාපොරොත්තු වූ නිසාය
(2) ඒවා සමාජ නායකත්ව වර්ධනය කිරීමේ බලාපොරොත්තු වූ නිසාය
(3) ඒවා ඉටුකර ගැනීමේ දී දුක් පීඩා ඇති නොවූ නිසාය
(4) ඒවා සාමූහික බලාපොරොත්තු වූ නිසාය

(33) වර්තමානයේ සහාව මුදල් පසුපස හඹා යන්නේ මන්ද?

A. දකින අසන දේ පිළිබඳව ආකර්ෂණය වන බැවිනි

B. සමාජය පරාර්ථකාමීත්වයෙන් වෙළී ඇති බැවිනි

C. ජනතාව දහමට ඇළුම් වන බැවිනි

D. තරඟකාරීත්වය සමාජය වසාගෙන ඇති බැවිනි

මින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A හා B ය.
(2) A හා C ය.
(3) A හා D ය.
(4) C හා D ය.

(34) "රෝගාතුරව සිටියෙමි. ඔබ මා බලාගන්නාහුය." මෙම ජේසුස් වහන්සේගේ ප්‍රකාශය සැබවින්ම ප්‍රායෝගික වූයේ,

(1) රෝගී වූ පියාට ප්‍රතිකාර කිරීමට පුතා පියාව විදේශ ගත කිරීමෙනි
(2) රෝගී වූ දිළිඳු කතකට සභා සාමාජිකයින් මුදලක් යැවීමෙනි
(3) ඒ දුගියා ලැබූ මුදලින් කොටසක් දිනපතාම පිළිකා රෝහලට යැවීමෙනි
(4) හදිසි අනතුරකට මුහුණ පෑ හිතවතිය බැලීමට ඔහු දිනපතා රෝහලට යෑමෙනි.

(35) පේදුරුතුමා අභියෝග ඉදිරියේ නොසැලුනු අවස්ථාවකට නිදසුනක් වන්නේ,

(1) පේදුරුතුමා ජේසුස් වහන්සේ නාඳුනන බව පැවසූ අවස්ථාවයි
(2) මන්ත්‍රණ සභාවෙන් අවසර නොලැබුවද දේශනා කළ අවස්ථාවයි
(3) ජේසුස් වහන්සේ නැගූ ප්‍රශ්න වලට පිළිතුරු සැපයූ අවස්ථාවයි
(4) පෙන්තකොස්ත දින දේශනය පැවැත් වූ අවස්ථාවයි

(36) දිළිඳු වැන්දඹුවන්ගේ පූජාවෙන් කිතුනුවාට ලැබෙන පණිවුඩය වන්නේ,

(1) පූජාවේ ඇතුළත් ත්‍යාගශීලිත්වය සැලකීමය
(2) සුදනන්ගේ වත් පොහොසත්කම් සැලකීමය
(3) පූජාවේ සංඛ්‍යාත්මක වටිනාකම් වැඩි කිරීමය
(4) පූජාවේ ඉලක්කය තීරණය කිරීමය

(37) මුල් සභාවේ ධර්මදූත මෙහෙවර තුළින් අද කිතුනුවාට ලැබෙන ප්‍රබල ආදර්ශය නම්,

(1) දිනපතා නමස්කාර හා සුව මෙහෙයන් පැවැත්වීමයි
(2) මුළු කාලයම ධර්මදූත මෙහෙවරට යෙදීමයි
(3) ජීවමාන ජේසුතුමා ගැන සාක්ෂි දැරීම හා ඉගැන්වීමයි
(4) සුබ සාධන මෙහෙවර සඳහා ජනතාව උනන්දු කරවීමයි

(38) සභා එකමුතුවක් සඳහා විශේෂයෙන් අවධාරණය කළ යුත්තේ,

(1) ක්‍රිස්තුස් වහන්සේ හිස වන නිසා මුළු ශරීරය ඒකාබද්ධ කරන බවයි
(2) ක්‍රිස්තුස් වහන්සේ ජාතීන් අතර වෛරයේ මැද බිත්තිය කැඩූ බවයි
(3) ක්‍රිස්තුස් වහන්සේ කුරුසියෙන් ලැබෙන කමාව අවධාරණය කළ යුතු බවයි
(4) ප්‍රේරිතවරුන් සියල්ල පොදුවේ තබා ගත යුතු බවයි

(39) වර්තමාන බහුවිධ සමාජය තුළ සහජීවනය ඇති කරීමේ නියැළෙන කිතුනුවා,

(1) සියලු බාධක අභිබවමින් දේව ප්‍රේමය සමාජය තුළ පතල කළ යුතුය
(2) සියලු විශ්වාස වල සමානාත්මතාවයක් ඇති බව පිළිගත යුතුය
(3) පරිසරය සුරැකීමේ මාර්ග සොයා බැලිය යුතුය
(4) ආරාධනා නැති වුවද සංස්කෘතික උතසව වලට සහභාගී විය යුතුය

(40) යෙසායා දිවැසිවරයාට කැඳවීම ලැබුනේ කුමක් සඳහාද?

A. අන්‍යජාතීන්ගේ පාපය කමා කිරීමටය

B. ජනතාවගේ ඇදහිල්ල වර්ධනය කිරීමටය

C. දෙවිඳුන්ගේ ශුද්ධවන්තභාවය ප්‍රකාශ කිරීමටය

D. දුෂ්කර කටුක කාර්යභාරයක් කිරීමටය

මින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A හා B ය.
(2) A හා C ය.
(3) A හා D ය.
(4) C හා D ය.

## ලකුණු දීමේ පටිපාටිය - 1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| (01 | 1 | (11 | 2 | (21 | 4 | (31 | 3 |
| (02 | 4 | (12 | 3 | (22 | 3 | (32 | 1 |
| (03 | 3 | (13 | 4 | (23 | 3 | (33 | 3 |
| (04 | 3 | (14 | 1 | (24 | 3 | (34 | 3 |
| (05 | 2 | (15 | 2 | (25 | 2 | (35 | 2 |
| (06 | 2 | (16 | 4 | (26 | 1 | (36 | 1 |
| (07 | 3 | (17 | 3 | (27 | 2 | (37 | 3 |
| (08 | 4 | (18 | 2 | (28 | 4 | (38 | 1 |
| (09 | 1 | (19 | 2 | (29 | 3 | (39 | 1 |
| (10 | 4 | (20 | 2 | (30 | 4 | (40 | 4 |

## ක්‍රිස්තියානි ධර්මය 11

**පළමු ප්‍රශ්නය හා තවත් තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**1. ප්‍රශ්න**

**i. .(අ)"මෙහෙසුරු දිවැසිවර" ලෙස හඳුන්වා ඇත්තේ කවුරන්ද?**

**(ආ) එසේ පවසා ඇත්තේ කුමන ප්‍රශංසා ගීතයේද?**

මෙහෙසුරු දිවැසිවර් ජොහාන් බෞතිස්ත

සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයේ **ලකුණු 02**

**ii. "නාසරෙත්හි සිනගෝගයේ ජේසුස් වහන්සේ සිය ප්‍රථම දේශනයේ ඉදිරිපත් කළ පිරුළු දෙක ලියන්න"**

"වෛද්‍යතුමාණනි ඔබ ඔබව සුව කරගන්න "

"ගමේ දිවැසිවරයා ගමට අගේ නැත" **ලකුණු 02**

**iii. (අ)"ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යෑමට උරදීමට සිදු වූයේ කා හටද?**

**(ආ) එයින් කිතුනු අපට ගෙන දෙන අභියෝගය කුමක්ද?**

සිරේනියේ සීමොන්

අපට නොසිතු ලෙස නොසිතු වෙලාවක දේව රාජ්‍යයේ මෙහෙවරට දායක වීමට ඇරයුම ලැබිය හැකිය. කුරුසියට උරුමය දීමට අපට ඇරයුම් ලද විට සිරේනියේ සීමොන් මෙන් එය පිළිගත යුතුය. එනම් අවශ්‍ය කෙනෙකුට උදව් වීමට ලැබෙන හදිසි කැඳවීමකි. **ලකුණු 02**

**iv. " ජීවමාන තැනැන්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද?**

**(අ) දෙව් දූතුන් මෙසේ පැවසුවේ කා හටද?**

**(ආ) එයින් අප ලබන වැදගත් පණිවුඩය කුමක්ද?**

සතියේ පළමු වනදා ජේසුස් වහන්සේ තැන්පත් කළ සොහොන වෙත ගිය ස්ත්‍රීන්ටය.

ජේසුස් වහන්සේ උත්ථාන වී ජීවමානව අප සමග අප අතර සැම විටම සිටින බවය. **ලකුණු 02**

v. **"ස්වාමිනි . . . . ඔබ මාගේ පියස යටට වැඩමවා ගැනීමට මම නොවටිමි. . . . වචන මාත්‍රයක් පැවසුව මැනව. මාගේ දාසයා සුව වන්නේය" ශතාධිපතියාගේ මෙම ප්‍රකාශයේ ඉදිරිපත් කරන වැදගත් චරිත ලක්ෂණ දෙකක් ලියන්න.**

ශතාධිපතියා තමා නොවටින බව කියා ජේසුස් වහන්සේ ඉදිරියේ නිහතමානී වීම.
ඔහුට තිබූ නොසැලෙන විශ්වාසය **ලකුණු 02**

vi. **(අ) දසපණතෙහි අඩංගු පොරොන්දුවක් සහිත පණත ලියා දක්වන්න?**

**(ආ) එය කී වෙනි පණතද ?**

නුඹේ පියාටද මවටද ගෞරව කරන්න. එවිට නුඹේ දෙවි සමිදාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහිය.

පස්වන පණතයි **ලකුණු 02**

vii. **<u>මට පෙරටුව</u> ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නාවූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි.**

**(අ) මෙම දිවැසිවැකිය ප්‍රකාශ කලේ කුමන දිවැසිවරයාද?**

**(ආ) තද අකුරින් ලියවී ඇති පදය පහදන්න?**

මලාකි දිවැසිවරයාය

ජොහාන් තුමා සමිඳුන්ට පෙරටුව ගොස් දේව රාජ්‍යය පිළිගැනීමට ජනතාවගේ සිත් සූදානම් කිරීම.

**ලකුණු 02**

viii. **(අ) ජේසුස් වහන්සේ මෙලොව ස්ථාපිත කළ නව ගිවිසුම කුමක්ද?**

**(ආ) එය ස්ථාපිත කළේ කුමන අවස්ථාවේද?**

ජේසුස් වහන්සේ තම ශරීරය හා රුධිරය වගුරුවා කුරුසිපත් වී අපේ පව් කමාව පිණිස කළ නව ගිවිසුම වේ.

එය ස්ථාපිත කළේ සිය ශ්‍රාවකයන් සමග පාස්කු මංගල්‍යය සැමරීමේ අන්තිම රාත්‍රී භෝජන වේලාවේදීය. රොටි කඩා මිදි යුෂ දීමෙන් සංකේතවත් කරන ලදි. **ලකුණු 02**

ix. **(අ) රාත්‍රි කාලයේ ජේසුස් වහන්සේ වෙත පැමිණ ඔහුගේ ප්‍රශ්න වලට විසඳුම් සෙවූ ජුදෙව් නායකයා නම් කරන්න?**

**(ආ) ජේසුස් වහන්සේ ඔහුට දුන් පිළිතුර මගින් කිතුනු අප අනුගත කර ගත යුත්තේ කුමන සත්‍යක්ද?**

නිකදේමුස්ය

ජීවිතයේ අභ්‍යන්තර වෙනසක් ඇති කර ගැනීම. ජේසුස් වහන්සේට ප්‍රේම කරමින් එතුමා අදහා ගැනීම මත පදනම් වූ අළුත් ජීවිතයක් **ලකුණු 02**

x. **ජේසුස් වහන්සේගේ උත්තරීතර ගුණාංගයක් වූ සමාවීම අනුගමනය කරමින් තමා හට වරදකළ අයට සිර මැදුරට ගොස් සමාව දානය කළ මෑත කාලීන පූජකවරු දෙදෙනෙක් නම් කරන්න.**

ගරු පීටර් ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා

දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ **ලකුණු 02**

**(මුළු ලකුණු 20)**

**(2) (i) " ඔබත් ගොස් එසේම කරන්න්" ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කා හටද? ඊට පසුබිම් වූ අවස්ථාව කුමක්ද?**

ජේසුස් වහන්සේ වෙත පැමිණි විනයධරයෙකුට
අසල්වැසියා කවරෙක්ද කියා ඔහු ජේසුස් වහන්සේගෙන් ඇසූ අවස්ථාවේදී **ලකුණු** 02

**(ii) (අ) එම අවස්ථාව පැහැදිලි කිරීමට ජේසුස් වහන්සේ ගෙනහැරපාන ලද උපමාවේ චරිත තුන මොනවාද?**

**(ආ) ඒ සඳහා ඔවුන් දැක්වූ ප්‍රතිචාර ලුහුඬින් ලියන්න.**

1. පූජකයෙක් - වැටී සිටි මිනිසා දැක පාරේ අනිත් පැත්තට ගියේය.
2. ලෙවියෙක් - වැටී සිටි මිනිසා දැක ඔහුද පාරේ අනිත් පැත්තට ගියේය.
3. සමාරියේ මිනිසෙක් - වැටී සිටි මිනිසා දැක ඔහු කෙරෙහි අනුකම්පා කොට තෙල් යුෂ ගල්වා, කොටළුවා පිට තබා තානායමට ගෙන ගියේය. එහිදී මුදල් දී මදි වුවහොත් නැවත ආ විට ගෙවීමට පොරොන්දු වී එම මිනිසා බලා ගැනීමට උපදෙස් දෙන ලදී.

**(iii) එම උපමා කථාවේ යහපත් චරිතය මගින් විදහාපාන, අප අනුගත කරගත යුතු ආදර්ශ පහක් විස්තර කරන්න.**

1. ජාති භේදයෙන් තොරව අවශ්‍ය අවස්ථාවේ පිහිට වීම.
2. තම කාලය වෙනත් අය සඳහා කැප කිරීම
3. මුදල් අවශ්‍ය අවස්ථාවේ අසල්වැසිකමින් බෙදාගෙන පිහිට වීම.
4. කොටළුවා පිට රෝගියා තබාගෙන යමින් තම පහසුකම් පවා පරිත්‍යාග කිරීම ලෙස අපද අපේ පහසුකම් පසක තබා උදව් වීම.
5. තමා සතු බෙහෙත් කැප කෙරුවා සේම අපට ඇති සම්පත් අන් අය සඳහා කැප කිරීමේ අවශ්‍යතාවය
6. සියලු භේද ඉක්මවා යමින් පරිත්‍යාගශීලීව කටයුතු කිරීම. **ලකුණු** 05

**මුළු ලකුණු** 10

**(3) (i)" ජුදා සමාජයේ සිටි ප්‍රධාන ආගමික කණ්ඩායම් ජේසුස් වහන්සේ හා සංවාදයේ යෙදුනි."**

**(අ) එකල ජුදා සමාජයේ සිටි ප්‍රධාන ආගමික කණ්ඩායම් දෙක නම් කරන්න.**

**(ආ) ඔවුන්ගේ මධ්‍යස්ථානය වූයේ කුමන ස්ථානද?**

පරිසිවරු - මධ්‍යස්ථානය - සිනගෝගය
සද්දුසිවරු - මධ්‍යස්ථානය - ජේරුසලමේ දේව මාලිගය **ලකුණු** 02

**(ii) එම ආගමික කණ්ඩායම් මගින් ජේසුස් වහන්සේ වෙත ඉදිරිපත් කළ පහත සඳහන් අභියෝග හා ප්‍රශ්න වලට ජේසුස් වහන්සේ දැක්වූ ප්‍රතිචාරය ලියන්න.**

**(අ) පව්කරුවන් ඇසුරු කිරීම පිළිබඳ අභියෝගය**

**(ආ) සබත් දින සුව කිරීම පිළිබඳ අභියෝගය**

**(ඉ) පුනරුජ්ජීවනය පිළිබඳ ප්‍රශ්නය**

(අ) පව්කරුවන් ඇසුරු කිරීමේ අභියෝගයට - ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය වූයේ "රෝගීන්ට මිස නිරෝගින්ට වෙදාගෙන් වැඩක් නැත. මා ආයේ පව්වුන් මිස නිරෝගින්ට දමිටුන් පසුතැවී සිත් හරවා ගැනීමට නොවේ."

සබත් දින සුව කිරීම - සබත් දින අප කළ යුත්තේ යහපතද නොහොත් අයහපතද? ප්‍රාණයක් නැසීමද නොහොත් ගළවා ගැනීමද? යනුවෙනි.

පුනරුජ්ජීවනය පිළිබඳ ප්‍රශ්නය - පුනරුජ්ජීවනයට පැමිණීමට වරම් ලද්දෝ අවහා විවහා වන්නේවත් නැත. ඔවුන්ට මරණයක් නැත. ඔවූහු දේවදූතයන්ට සම වෙති කියා කියූ සේක.

**ලකුණු** 03

**(iii) එදා ආගමික කණ්ඩායම් සමග ඇතිවූ එම සංවාද වලදී ජේසුස් වහන්සේගේ ප්‍රතිචාර වලින් කිතුණු අපට අවධාරණය කරන උතුම් ගුණාංග කවරේද?**

අපට අවධාරණය කෙරෙන උතුම් ගුණාංග

1. නොමග ගිය අය ඇසුරු කරමින් ඔවුන් යහමගට ගැනීමේ වැදගත්කම
2. නීතියට වඩා මිනිස්කම උතුම් බව පිළිගැනීම
3. සබත් දිනයේ / ඉරිදා දවසේ පවා යහපතට නැඹුරු වීම
4. සමාජයේ කොන් වූවන්ට දයානුකම්පාව දැක්වීම
5. පුනරුජ්ජීවනය ඇති බවත් ඒ සඳහා වරම ලබා ගැනීමේ වැදගත්කම අවධාරණය කිරීම.

**ලකුණු** 05

**මුළු ලකුණු** 10

**(4) "ජේසුස් වහන්සේ විශිෂ්ඨ ගුරුවරයෙක් විය"**

**(i) දේව රාජ්‍යයේ ගැඹුරු ගුණධර්ම පොදු ජනතාවට ඉදිරිපත් කිරීමෙහිලා භාවිතා කළ උපක්‍රම දෙකක් ඉදිරිපත් කරන්න.**

ඇරමික් බස භාවිතය, උපමා කථා, පරිසරය භාවිතය හාස්කම් ආදිය **ලකුණු** 02

**(ii) මිටියාවතේ දේශනය මගින් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ භාග්‍ය වාක්‍ය තුන සම්පූර්ණ කරන්න.**

I. දිළිඳු ඔබ භාග්‍යවන්තයෝය - මන්ද
II. සාගිනි වූ ඔබ භාග්‍යවන්තයෝය - මන්ද
III. කඳුළු සලන ඔබ භාග්‍යවන්තයෝය - මන්ද

දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝය - මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබගේය.

සාගිනි ඇති ඔබ භාග්‍යවන්තයෝය - මන්ද ඔබ තෘප්තිමත් වනු ඇත.

කඳුළු හෙළන ඔබ භාග්‍යවන්තයෝය - මන්ද ඔබ සිනා සෙනු ඇත

**ලකුණු** 03

**(iii) කිතුනු ඔබ එම වාක්‍ය පදනම් කරගෙන එහි අධ්‍යාත්මික සත්‍යන් ජීවිතය තුලින් ක්‍රියාවට නංවන්නේ කෙසේද?**

- දේව වචනය ඇසීමට ඇති අවශ්‍යතාවය නිසා දේව රාජ්‍යට හිමිකම, අන් අයට සේවයට පෙළඹවීම.
- දේව වචනය ඇසීමට ඇති සාගින්න මගින් තෘප්තිමත්වීම.
- දේව වචනය ජීවිතයට අනුගත කරගෙන අවශ්‍යතා ඇති අයට සේවය කිරීම.
- දුකට පීඩාවට පත්ව සිටින අය සමග ශෝක වීම හා ඔවුන් එම තත්වයෙන් මිදීමට පියවර ගැනීම ඒ මගින් ප්‍රීති වීමටත් දේව රාජ්‍යයට හිමිකම් ලැබීමේ භාග්‍ය නිසා ඇති වන සන්තෝෂයයි.

**ලකුණු 05 මුළු ලකුණු 10**

**(5) (i) (අ) 1 වන ධර්මදූත චාරිකාව සඳහා පාවුල් සමග යෑමට තෝරා ගනු ලැබූ අනික් ධර්මදූත සේවකයා නම් කරන්න**

**(ආ) මොවුන් තෝරා ගැනීමට පෙර අන්තියෝකයේ ගෝළයන් සූදානම් වූයේ කෙසේද?**

(අ) බර්ණබස්

(ආ) යාච්ඤාවෙන් හා උපවාසයෙන් **ලකුණු 02**

**(ii) පහත සඳහන් ස්ථාන අතුරින් තුනක් තෝරා ධර්මදූත සේවකයන් එම ස්ථාන වලදී මුහුණ දුන් අභියෝග ඉදිරිපත් කරන්න**

**(අ) පාපස් (ආ) ලුස්ත්‍රාව**

**(ඊ) ඇතැන්ස් (ඉ) පිලිප්පිය**

(අ) පාපස්

බාර් ජේසුස් නම් විජ්ජාකාරයා දේව වචන ප්‍රකාශයට අවහිර කිරීම, එහෙත් ශුද්ධාත්ම බලයෙන් ඔහුව අභිබවා ගොස් ප්‍රධානියාට දේශනා කිරීම, බොහෝ දෙනෙක් අදහා ගැනීම.

(ආ) ලුස්ත්‍රාව

උපන්දා පටන් කොරවූ මනුෂ්‍යයෙක් සුවපත් කිරීම, එවිට බර්ණබස් හා පාවුල් දේවත්වයේ ලා සැලකීමට උත්සහ දැරීම, එය වළක්වා දෙවියන් වහන්සේට එම ගෞරවය හිමි කිරීම.

(ඉ) පිලිප්පිය

අශුද්ධත්මයක් පහකර යැවීම නිසා ඔවුනට තලා පෙලා සිරගත කිරීම, එහෙත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම, සිරගෙයින් නිදහස් කිරීමට රහසින් තැත් කලද යුක්තිය සඳහා නැගී සිටීම.ප්‍රසිද්ධියේ මුදා හැරීමට ඉල්ලීම.

(ඊ) ඇතන්ස්

නාඳුනන දෙවියන්ට කැප වූ පූජාසනය මගින් ජේසුස් වහන්සේ හඳුන්වා දීමට අවස්ථාව ගැනීම. එම නගරයේ එපිකූරිය සහ ස්තෝයික පණ්ඩිතයන් සමග සාකච්ඡා කර ජේසුස් වහන්සේ හඳුන්වා දීම. ඔවුන්ගේ සංස්කෘතියට අයත් සාහිත්‍ය කෘති මගින් සැවොම දේව දරුවන් බව ඒත්තු ගැන්වීම. **ලකුණු 03**

**(iii) එම අවස්ථාවලදී ධර්මදූත සේවකයන්ගේ ක්‍රියාකාරීත්වයෙන් වත්මන් කිතුනුවන්ට සහ ධර්මදූත සේවකයන්ට ගත හැකි මගපෙන්වීම් පහක් ලියන්න.**

- සෑම අවස්ථාවටම එඩිතරව මුහුණදෙමින් ඉදිරියට යෑම
- නායකත්වය හවුලේ තබා ගැනීම
- ශුද්ධාත්ම මග පෙන්වීම මගින් ක්‍රියාකාරී වීම
- තමාට වාසි නොගෙන දෙවියන්වහන්සේට නිසි ගෞරවය පුද කිරීම
- ආශ්චර්ය ක්‍රියා මගින් ජනතාවට සේවය කිරීම.
- දේශන මගින් උත්ථාන වූ ජේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීම .
- යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පිළිම වන්දනාවේ නිෂ්ඵලතාවය වටහා ගන්නා පරිදි සුභාරංචිය පැතිර වීම. ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම. **ලකුණු** 05

**මුළු ලකුණු** 10

**(6) "ඔබේ වස්තුව කොතැනද ඔබේ සිතත් එතැනය"**

**(i) වස්තුව පිළිබඳ මෙලෙස පැවසූ ජේසුස් වහන්සේ ලෞකික ධන සම්පත්වල ආදීනව දැක්වීමට ගෙනහැර පාන ලද උපමා දෙක සඳහන් කරන්න.**

පොහොසත් මෝඩයාගේ උපමාව සහ ධනවතා සහ ලාසරස්ගේ උපමාව **ලකුණු** 02

**(ii) එම උපමා කථා මගින් ජේසුස් වහන්සේ ධනය සම්බන්ධයෙන් අනාවරණය කළ වැදගත් ආකල්ප තුනක් ලියන්න.**

I. ලෞකික ධනයේ ආදීනව
II. ලෞකික ධනය බෙදාගැනීමේ වැදගත්කම
III. ලෞකික ධනය විනාශයට පත් වන බව
IV. ලෞකික ධනය තාවකාලික බව
V. ලෞකික ධනය දේව රාජ්‍යයට/ ස්වර්ග රාජ්‍යයට ගෙන යෑමට නොහැකි බවත්ය **ලකුණු** 03

**(iii) දිළිඳු බව පිටු දැකීම සඳහා ඔබ අතර ජීවත්වන දිළිඳු ළමයෙකුට එම තත්වයෙන් ඔබ කෙසේ ක්‍රියා කරන්නේද යන්නට කරුණු පහක් ඉදිරිපත් කරන්න.**

- මුදලින් උපකාර කිරීම.
- තමා සතු දැනුම හා තලෙන්ත භාවිතා කර ඔහුට පිහිට වීම.
- එම ළමයා තුළ ඇති විශේෂතා හඳුනාගෙන පිළිගැනීමට ලක් කිරීම.
- එම ළමයාගේ පවුලේ අයගේ ආර්ථික තත්වය නගාලීම සඳහා කිතුනු සංගමය, දේවස්ථානය මගින් පියවර ගැනීම.
- අධ්‍යාපන අංශයෙන් උදව් කරමින් අනාගතය දීප්තිමත් කරගැනීමට අතහිත දීම.
- සෙසු ශිෂ්‍යයන් සමග එක් වී අධ්‍යාපන පහසුකම් පොතපත ආදිය ගැනීම සඳහා දායක වීම.

තවත් මෙවැනි ප්‍රශ්නයට ගැළපෙන අදහස් ලියා ඇත්නම් ලකුණු දෙන්න **ලකුණු** 05

**මුළු ලකුණු** 10

**(7) පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.(බයිබලයේ උදාහරණ සහිතව)**

- **(i)** **යාච්ඤාව**
- **(ii)** **ස්තුතිවන්තභාවය**
- **(iii)** **මුල් කිතුනු සභාවෙන් වත්මන් සභාවට ආදර්ශ**
- **(iv)** **දිවැස්මෙහෙවරවල වැදගත්කම**

(i) යාච්ඤාව

කිතුනුවන් සතු ප්‍රබල අවියක් බව, දෙවියන්වහන්සේ හා සබඳතා පවත්වා ගැනීමේ වැදගත් අංගයක් ජේසුස් වහන්සේ යාච්ඤාව භාවිතා කළ අවස්ථා හා ඊට නිදසුන්, පරික්ෂාවේ නොවැටීමට මගක් වීම. දේව කැමැත්ත සොයා එයට අවනත වීම.

උදා: ගෙත් සෙමන උයනේ යැදුම, ස්වාමින්ගේ යාච්ඤාවෙන් ගෙනහැර පාන විශේෂ ගුණාංග එනම් දෛනික අවශ්‍යතා යැදුම, අන් අයට කමා වෙමින් තම වැරදි වලට කමා ඉල්ලීම, ශුද්ධාත්ම මග පෙන්වීමෙන් ශක්තිය ලැබීම.

(ii) ස්තුතිවන්තභාවය

දෛනික යැදුම් වලදී අනීත් සියලු ආශිර්වාදවලට ස්තුති කරීම, යාච්ඤාවට ලැබෙන පිළිතුරු සඳහා ස්තුති කිරීම, කිතුනුවන් ලෙස එම පවුලට අයත් වීම ගැන ස්තුති පිදීම. සුවය, ආරක්ෂාව හා දිනපතා ඇති ප්‍රශ්න වලින් ගොඩ ගැනීම ආදියට ස්තුති කරීම, එහි අගය වටහා දීමට ලාදුරු රෝගීන් දස දෙනාගේ පුවත සඳහන් කිරීම යෝග්‍ය වේ.

(iii) මුල් කිතුනු සභාවේ විශේෂිත ලක්ෂණ

සාමුහිකත්වය, බෙදාගැනීම, යාච්ඤාව, අන් අයගේ අවශ්‍යතා ගැන සැලකිලිමත් වීම දේව වචනය හැදෑරීම, රොටී කැඩීමෙන් සහෝදරත්වය හා සහභාගීත්වය සමානාත්මතාවයන් සියලු දෙනා පිළිගැනීම, සාකච්ඡවෙන් විසඳුම් සෙවීම, ශුද්ධාත්ම මග පෙන්වීමට විවෘත වන රැස්වීම් පැවැත්වීම. (යනාදී තවත් කරුණුය)

(iv) දිවැස්මෙහෙවරවල වැදගත්කම

දිවැස් මෙහෙවර මගින් අනාවරණය කළ සත්‍යන් ජේසුස් වහන්සේගේ පැමිණීම, එතුමාගේ මාර්ගය පිළියෙල කිරීමේ කාර්ය - මලාකි/ යෙසායා, ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා මරණය හා උත්ථානය - යෙසායා

සාම පුවත - මීකා, සාධාරණත්වයේ වැදගත්කම, - ආමොස්, දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය යෙසායා එබඳු අනාවැකි මගින් එදා ඉශ්‍රායෙල් ජාතිය පසුතැවිලි වීමට කැඳවීම මෙම කිතුනු අපටද එම කැඳවීම සාධාරණ වන බව කිතුනු සමාජය කෙරෙහි දක්වන අභියෝගය මෙම දිවැසි වැකකි වල අඩංගු වේ.

**එක් කෙටි සටහන්කට ලකුණු 05 බැගින්**

**මුළු ලකුණු 10**

සියලු ලිපි -

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ
ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම
368/6, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

0112679343

## සුදුසුකම්

* කිතුනු ගුරුවරුන්ගේ පුහුණුව සඳහා සකස් කරන ලද මෙම පාඨමාලාව කිතු දහම පිළිබඳ තමන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට කැමති සියළු කිතුනුවන්ට විවෘතය.
ඉල්ලුම්කරුවන් යටත් පිරිසෙයින් පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුයි.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය සමඟ සමත් වීම, හා එකී විභාගයේදී සම්මාන 3ක් (භාෂාව, ක්‍රිස්තු ධර්මය ඇතුළු තව එක් විෂයයක්) සම්මාන සහිත වීම.
(රෝමානු කතෝලික නොවන)

අධ්‍යාපන සුදුසුකම් දක්වන සහතිකවල පිටපත් සහ දේවගැතිතුමා සහතික කරන ලද ලිපිය, ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුයි.

සැයු :- මෙම විභාගයට අදාල ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ දහම් පාසල් පොදු පාඨමාලාව මත පදනම් වූවකි.
කිතු දහම ඉගැන්වීමට ගුරුවරු බඳවා ගැනීමේදී මෙම විභාගයෙන් සමත් වීම අවම සුදුසුකමක් ලෙස රජය පිළිගෙන ඇත.

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම මෙහෙයවන

ආගමික දැනුම පිළිබඳ ජාතික සහතික විභාගය (ධර්මාචාර්යය)

මෙම විභාගය සෑම වසරකම ඔක්තෝම්බර් මස දෙවෙනි සෙනසුරාදා

**අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය ජූලි 31 දාය.**

ලියාපදිංචි කිරීමේ ගාස්තුව
රු.1000.00 දාහකි

එම මුදල් චෙක්පතකින් හෝ මුදලින් එවිය හැක. එසේ නැත්නම්, ටොරිංටන් චතුරශ්‍ර ශාඛාවේ ලංකා බැංකුව ගිණුම් අංක 0002322844 -ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට තැන්පත් කර, ඔබ ලබා ගන්නා **කුවිතාන්සිය** අයදුම්පත සමඟ අප වෙත යොමු කරන්න.
(මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

## විෂය නිර්දේශය



(අ) ජේසුස් වහන්සේගේ ජීවිතය
ජේසුස් වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම පිළිබඳ ශුභාරංචි 4 පදනම් කරගෙන අධ්‍යයනය.


(ආ) පුරාණ ගිවිසුම
i. ඉශ්‍රායෙල් ජනනායක චරිත හා ක්‍රියාකාරිත්වය ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්, ජෝසෙප්, සහ මෝසෙස්.
ii. රජවරු-සාවුල්, දාවිත්, සලමොන් යටතේ ඉශ්‍රායෙල් රාජ්‍යයේ ඉතිහාසය.
iii. දිවැසිවරු- එලියා, එලිෂා පිළිබඳ සාමාන්‍ය අවබෝධය සහ සේවය.

(ඉ)




ආමොස් නමැති දිවැසිවරයාගේ පසුබිම හා ඉගැන්වීම පිළිබඳ පූර්ණ දැනුමක් බලාපොරොත්තුවනු ඇත.

(ඊ) රෝමවරුන්ට ලියන ලද යැවුම් පත්‍රය පිළිබඳ තියුණු අධ්‍යයනයක් අවශ්‍ය වනු ඇත.






(උ) ක්‍රිස්තු වර්ෂ 451 දක්වා
කිතුනු සභා ඉතිහාසයේ පූර්ණ දැනුමක් ලබා ගත යුතුයි.

(ඌ) සභා ඉතිහාසයට ඇතුළත්

වැදගත් චරිත මාටින් ලූතර්,ජෝන්කැල්වින්, ජෝන් වෙස්ලි, විලියම්බූත්, ජෝසප් වාස්, ඉව්ලින් කානි- මොවුන් හා ඔවුන්ගේ සේවය ගැන අවබෝධය.

ඩිඩකේ
ඩයෝග්නීටස්




( එ)
අපෝස්තුළුවරුන්ගේ

National Certificate of Religious Knowledge

## Application Form

Name

Adress - ..................................................
..................................................
..................................................

Date of Birth

Denomination- ..................................................

City applied to sit for the exam ............
..................................................

Tel

Medium - ............................
Registration fee has been paid by (cheque/ cash/cash deposit) cross the unnecessary word.

..................................................
Signature

..................................................
Name & the Signature of Priest in charge

**<u>ඔබගේ දැන ගැනීම පිණිසයි</u>**

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

# ක්‍රිස්තු ධර්මය

- ❖ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2008 සිට 2012 දක්වා පොත
- ❖ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2013 පමණක්
- ❖ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2014 පමණක්
- ❖ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2015 පමණක්
- ❖ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2016 පමණක්

*ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ*
*ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම,*
*368/6, බෞද්ධාලෝක මාවත,*
*කොළඹ 07*

දුරකථන අංකය- 011 2679343
ෆැක්ස් අංකය - 0112671721
විද්‍යුත් තැපෑල - edu@nccsl.org